# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2395/15 - 2024 ජූලි මස 30 වැනි අඟහරුවාදා - 2024.07.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම මේ නිවේදනයෙන් ;

01. කුරුණෑගල, මල්කඩුවාව, හෙරලියාවල කර්මාන්ත පුරය දරන ස්ථානයේ පිහිටි "ග්‍රීන් වැලි ෆාර්ම(ර්) සොසයිටි" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි ; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

වෛද්‍ය **රමේෂ් පතිරණ,**
කර්මාන්ත අමාත්‍ය.

2024 ක් වූ ජූලි මස 25 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
නො. 73/1,
ගාලු පාර,
කොළඹ 03.

EOG 07 - 0295